# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1877/5 - 2014 අගෝස්තු මස 25 වැනි සඳුදා - 2014.08.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල**
**පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත**
**(262 වන අධිකාරය වූ)**
**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ**
**කල්මුණේ මහ නගර සභාවේ**
**සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

අවසර නොලබා සභාවේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණ නොසිටීම හේතු කොට ගෙන කල්මුණේ මහ නගර සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

අබුබක්කර් මීරාසායිබු මොහමඩ් සිරාස් නම් වූ තනතුර දැරූ සභිකයා අයත් වන ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම්ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ කල්මුණේ මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු වන අහමඩ් ලෙබ්බෙ ආතම්බාවා අබ්දුල් මජීඩ් මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

කල්මුණේ මහ නගර සභාවේ තේරීම් භාර නිලධාරී දොන් තිළිණ ඉෂාන් වික්‍රමරත්න වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, අහමඩ් ලෙබ්බෙ ආතම්බාවා අබ්දුල් මජීඩ් මහතා කල්මුණේ මහ නගර සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත් කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

තිළිණ වික්‍රමරත්න,
තේරීම් භාර නිලධාරී,
කල්මුණේ මහ නගර සභාව.

2014 අගෝස්තු මස 22 වන දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

09 - 230


1A - G 20110 — 15 (2014/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*